සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

◈ **අංක 01 සිට 10 ඇති ප්‍රශ්න සඳහා දී ඇති නම් පහෙන් එකක් අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නමෙහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. නේපල්ස් 2. රෝමය 3. ජිනෝවා
4. මිලාන් 5. වේල්ස් (.....)

02. 1. ප්‍රංශය 2. යුගෝස්ලාවියාව 3. ස්පාඤ්ඤය
4. බෙල්ජියම 5. පෘතුගාලය (.....)

03. 1. පිරනීස් කඳුවැටිය 2. ඩැනියුබ් ගඟ 3. කොන්ස්තන්තිනෝපලය
4. බෝලාන් දුර්ගය 5. පෝලන්ත කපොල්ල (.....)

04. 1. රජතුමා 2. අගමැතිවරු 3. පූජකවරයා
4. වංශාධිපතිවරයා 5. ප්‍රවේණි දාසයා (.....)

05. 1. 7 වැනි හෙන්රි 2. 8 වැනි හෙන්රි 3. මාරි ඇන්ටොයිනට් බිසව
4. මේරි ටියුඩර් 5. පළවැනි එළිසබෙත් (.....)

06. 1. 1689 අයිතිවාසිකම් පණත 2. 1765 මුද්දර පණත
3. 1832 මහා ප්‍රතිසංස්කරණය පණත 4. 1812 ප්‍රතිසංස්කරණ පණත
5. 1911 පාර්ලිමේන්තු පණත (.....)

07. 1. අයිලා චැපෙල් 2. ට්‍රෙන්ට් 3. ලයිබැක්
4. ට්‍රොපව් 5. වෙරෝනා (.....)

08. 1. 2 වෙනි ජූලියස් 2. 10 වැනි ලියෝ 3. 6 වැනි ඒඩ්‍රියන්
4. 2 වන කැතරින් 5. 7වැනි ක්ලෙමන්ට් (.....)

09. 1. ෂේක්ස්පියර් 2. මිල්ටන් 3. බොකැෂියෝ
4. වර්ඩ්ස්වර්ත් 5. චාල්ස් ඩිකන්ස් (.....)

10. 1. කෙරෙන්ස්කි 2. ලෙනින් 3. ට්‍රොට්ස්කි
4. රොබෙස්පියර් 5. ස්ටාලින් (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල දී ඇති පද යුගල වලින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලයෙහි අංකය වරහන තුළ ලියන්න.**

11. 1. රෝමය - ටයිබර්
2. ලිස්බන් - ටාගුස්
3. ජිනීවා - රෝන්
4. වොර්සෝ - විස්ටියුලා
5. බර්ලින් - එල්බ් (.....)

12. 1. සත් සති යුද්ධය - ඔස්ට්‍රියාව හා ප්‍රශියාව
2. හත් අවුරුදු යුද්ධය - ප්‍රංශය හා ස්පාඤ්ඤය
3. ක්‍රිමියන් යුද්ධය - රුසියාව හා තුර්කිය
4. ට්‍රැෆල්ගාර් සටන - ප්‍රංශය හා එංගලන්තය
5. ජෙනා සටන - ප්‍රංශය හා ප්‍රශියාව (.....)

13. 1. ප්‍රංශයේ ජාතික රාජ්‍ය - රිචලියු
2. වියානා සමථය - මෙටර්නික්
3. අයිලා චැපෙල් සම්මේලනය - පාමර්ස්ටන්
4. තරුණ ඉතාලිය - මැසිනි
5. බර්ලින් සම්මේලනය - බිස්මාර්ක් (.....)

14. 1. ගුසියාඩිනි - ඉතාලියේ ඉතිහාසය
2. තෝමස් හොබ්ස් - රජය හා විප්ලවය
3. ඊ.එච් කාර් - ඉතිහාසය යනු කුමක්ද
4. ඇඩම්ස්මිත් - ජාතීන්ගේ ධනය
5. හෙරඩෝටස් - පොලොපොනිසියානු යුද්ධයේ ඉතිහාසය (.....)

15. 1. ජෙසුයිට් - කතෝලික මිෂනාරි නිකායකි
2. කාබොනාරි - රහස් සංගමයකි.
3. සොල්වරයින් - තීරු බදු සංගමයකි
4. දාස්කැපිටාල් - ස්ටාලින්ගේ කෘතියකි.
5. ජුන්කර් - ඉඩම්හිමි ප්‍රශියානු රදල පන්තියකි. (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. x හා y තීරු ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| X | Y |
|---|---|
| 1. හිපොක්‍රටීස් | A ''රාජ්‍ය නම් මම වෙමි'' |
| 2. සොක්‍රටීස් | B ''සියලු දේ මනින මිම්ම මිනිසාය'' |
| 3. හතරවන හෙන්රි | C ''සද්භාවය වූකලී දැණුමයි'' |
| 4. ප්‍රොටගරස් | D ''මම පැමිණියෙමි, මම දුටිමි. මම ජය ගතිමි'' |
| 5. ජූලියස් සීසර් | E ''සෑමරෝගයකටම ස්වභාවික හේතුවක් ඇත.'' |

1. EACBD 2. ECABD 3. ACBDE
4. ABEDC 5. BCDAE (.....)

17. X Y

| X | Y |
|---|---|
| 1. වීනස් | A අත්කම්වලට |
| 2. නෙප්චූන් | B මුහුදට අධිපති |
| 3. සෙරෙස් | C යුද්ධයට අධිපති |
| 4. මාර්ස් | D ආලයට අධිපති |
| 5. මිනර්වා | E සරුසාර අස්වැන්නට අධිපති |

1. BCADE 2. EABCD 3. DBECA
4. ADCEB 5. CADEB (.....)

18.

| X | Y |
|---|---|
| 1. ප්ලීන | A පරමාදර්ශී රාජ්‍යය |
| 2. අල්හසන් | B දින දර්ශනය |
| 3. ප්ලේටෝ | C නවීන විශ්ව කෝෂය |
| 4. සොෆිගිනස් | D වෛද්‍ය විද්‍යාවේ පරිචය |
| 5. රශේස් | E දෘෂ්ටි විද්‍යාව |

1. ACDEB 2. CABDE 3. BACDE
4. ECABD 5. CEABD (.....)

19.

| X | Y |
|---|---|
| 1. හොප්වෙල් | A මාතෘ මූලික සමාජයකි |
| 2. ඉරොක්කොයිස් | B පූජකවරුන්ගේ නායකත්වය |
| 3. පියුබ්ලෝ | C ගෝත්‍ර ජනතාව අතර වෙළඳ ගනුදෙනු සිදුවීම. |
| 4. මායාවරු | D ආජන්ටිනා ප්‍රදේශය දක්වා ව්‍යාප්ත විය |
| 5. ඉන්කාවරු | E මහල් නිවාසවල පදිංචි විය. |

1. CAEBD 2. DEBCA 3. ACDBE
4. CDEAB 5. BADEC (.....)

20.

| X | Y |
|---|---|
| 1. දෙවැනි පිලිප් | A ඔස්ට්‍රියාව |
| 2. හතරවැනි හෙන්රි | B ස්පාඤ්ඤය |
| 3. මරියා තෙරේසා | C රුසියාව |
| 4. දෙවැනි නිකලස් | D පීඩ්මොන්ට් හා සාඩිනියා |
| 5. වික්ටර් ඉමැනුවෙල් | E ප්‍රංශය |

1. ABCED 2. ADCEB 3. BCDAB
4. BEACD 5. BCADE (.....)

21. X Y

1. ෆෝක්ලන්තය — A කැරිබියන්
2. ග්‍රීන්ලන්තය — B පැසිපික්
3. ටොබාගෝ — C ආක්ටික්
4. බර්මියුඩා — D මධ්‍යධරණී
5. සිසිලි — E අත්ලාන්තික්

1. ABEDC 2. ECBAD 3. DCABE
4. EACDB 5. CDABE (.....)

22. X Y

1. බලතල වෙන්කිරීම — A ෆ්‍රැන්සිස් පෙට්රාක්
2. උපයෝගීතාවාදය — B ඇඩම්ස්මිත්
3. මානවවාදය — C කාල්මාක්ස්
4. රාජ්‍ය නිර්බාධවාදය — D ජෙරමි බෙන්තම්
5. විද්‍යාත්මක සමාජවාදය — E මොන්ටෙස්ක්‍යු

1. DEABC 2. ABCDE 3. EDABC
4. BDCAE 5. ECBED (.....)

23. X Y

1. ෆ්‍රැන්ක්ෆර්ට් — A පෘතුගාලය
2. ලිස්බන් — B ප්‍රංශය
3. මාර්සෙල්ස් — C පෝලන්තය
4. බෙල්ග්‍රේඩ් — D යුගෝස්ලාවියාව
5. වොර්සෝ — E ජර්මනිය

1. EABDC 2. ABDEC 3. ECDAB
4. CDBAC 5. BACDE (.....)

24. X Y

1. රයින් සංයුක්තය — A බිස්මාර්ක්
2. ජර්මන් සංයුක්තය — B පළමුවන නැපෝලියන්
3. උතුරු ජර්මන් සංයුක්තය — C පළමුවන කයිසර් විලියම්
4. ජර්මන් අධිරාජ්‍ය — D හින්ඩෙන්බර්ග්
5. වයිමාර් සමූහාණ්ඩුව — E වියානා සම්මේලනය

1. ABEDC 2. DACAB 3. BEACD
4. EBCDA 5. ACDEB (.....)

25. X Y

1. ඩොනටෙලෝ — A වීනස්ගේ උපත
2. මයිකල් ආන්ජිලෝ — B මොනාලිසා
3. ටිටියන් — C මෝසස්
4. ලියනාඩෝ ඩාවින්චි — D V වන චාල්ස්
5. බොට්ටිසෙල්ලි — E ඩේවිඩ්

1. ECDBA 2. ABECD 3. CDAEB
4. BACDE 5. DCBAE (.....)

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා එක් ක් ප්‍රශ්නයට දක්වා ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද
B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද
C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද
A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පහත සඳහන් ආණ්ඩුක්‍රම අතරින් ග්‍රීක පෞර රාජ්‍යවල පැවති ආණ්ඩුක්‍රම කවරේද?
A) පූජක තන්ත්‍රය B) කතිපයාධිපති ආණ්ඩුව
C) ප්‍රජාතන්ත්‍රවාදය D) අධිරාජ්‍යය (.....)

27. පහත සඳහන් ඒවා අතරින් දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් සාධක කවරේද?
A) බෝල්කන් අර්බුදය
B) ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව සහ රුසියාව යන රටවලින් සමන්විත වූ ත්‍රිත්ව මිත්‍ර සංධානය
C) වර්සායි ගිවිසුමේ අඩුපාඩු
D) ඉතාලියේ හා ජර්මනියේ පැසිස්ට්වාදය හා නාසිවාදය නැඟී ඒම. (.....)

28. පහත දැක්වෙන කරුණු අතරින් යුරෝපයේ නූතන යුගයේ ලක්ෂණ මොනවාද?
A) ජාතික රාජ්‍ය පිහිටුවීම. B) වෙළඳ හා වාණිජ කටයුතු වල දියුණුව
C) ප්‍රවේණි ක්‍රමය D) පාප් වහන්සේගේ ආධිපත්‍ය (.....)

29. පහත දැක්වෙන රටවල් අතරින් ආරම්භයේදීම ජාතීන්ගේ සංවිධානයට බැඳුන රටවල් මොනවාද?
A) ප්‍රංශය B) එංගලන්තය
C) ඇමරිකන් එක්සත් ජනපදය D) ජර්මනිය (.....)

30. පහත දැක්වෙන පුද්ගලයින් අතුරෙන් ඉතාලි එක්සත් ව්‍යාපාරයට සම්බන්ධ වූවෝ කවරහුද?

A) ෆ්‍රැන්සිස් බේකන් B) ජියෝවන්නි බර්නිනි

C) ගැරිබෝල්ඩ් D) කැවුවර් (.....)

- **අංක 31 - 35 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාව යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. නැපෝලියන් බොනපාට්

1. 1802 දී යාවජීව කොන්සල්වරයා බවට පත්වීම.
2. ලයිසිස් නම් අධ්‍යාපන ආයතනය ඇති කරන ලදී.
3. වෝටර්ලූහිදී ඔහු විසින් මිත්‍ර හමුදා පරාජය කරනු ලැබීය.
4. ප්‍රංශයට පොදු නීති සංග්‍රහයක් හඳුන්වා දුනි.
5. ලෙත්‍රෙදි කැචේ වරෙන්තු ක්‍රමය ඇතිකරන ලදී. (.....)

32. දේශගවේෂණ ව්‍යාපාරය

1. කොලොම්බස් විසින් ඇමරිකා මහද්වීපය සොයා ගැනීම.
2. වස්කෝද ගාමා කැලිකට් වෙත ළඟා වීම.
3. මැගලන් ලෝකය වටා යාත්‍රා කිරීම
4. ඩොයිම්ලර් විසින් අප්‍රිකාව සොයා ගැනීම.
5. කබ්රාල් බ්‍රසීලයට සේන්දු වීම. (.....)

33. එංගලන්තයේ කාර්මික විප්ලවය ඇතිවීමට තුඩුදුන් හේතු

1. අවශ්‍ය ප්‍රාග්ධනය තිබීම
2. අවශ්‍ය ස්වභාවික සම්පත් තිබීම.
3. අවශ්‍ය ක්‍රමය තිබීම.
4. අවශ්‍ය වෙළඳ පොළ තිබීම.
5. අවශ්‍ය ශක්තිමත් හමුදාවක් තිබීම. (.....)

34. බිස්මාක් විසින් දරණ ලද තනතුරු

1. ජර්මන් සංයුක්තයේ ඩයට් සභාවේ ප්‍රෂියානු නියෝජිතයා
2. ශාන්ත පීටර්ස්බර්ග් හි ප්‍රෂියානු නියෝජිතයා
3. පැරිස් නුවර ප්‍රෂියානු නියෝජිතයා
4. ප්‍රෂියාවේ චාන්සලර්වරයා
5. එක්සත් ජර්මනියේ අධිරාජ්‍යා (.....)

35. II ලෝක යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා දරණ ලද ප්‍රයත්න

1. 1919 දී ජාතීන්ගේ සංගමය පිහිටුවීම.
2. 1925 දී ලොකාර්ගෝ ගිවිසුම අත්සන් කිරීම.
3. 1932 නිරායුධකරණ සම්මේලනය
4. 1935 ඉතාලිය ජාතීන්ගේ සංගමයෙන් ඉවත්විය.
5. 1938 මියුනික් සමථය (.....)

- 36 සිට 40 දක්වා ප්‍රශ්නවල අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

❖ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නයට වඩාත් හොඳින් ගැළපෙනුයේ කවර ප්‍රකාශ යුගලයදැයි වගුවෙන් තෝරන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. වෝල්ටෙයාර් බලතල පංගුකිරීමේ න්‍යාය ඉදිරිපත් කළේය. | ලිවී සහ ටැසිටස් යනු පුරාණ රෝමයේ සිටි වැදගත් ඉතිහාසඥයන් දෙදෙනෙකි. (.....) |
| 37. ග්‍රීක චින්තනයේ හා සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණයක් තර්ක බුද්ධිය කෙරෙහි ඇති අවධාරණය සහ බුද්ධිවාදී සම්ප්‍රදායක් වර්ධනය වීමයි. | විද්‍යාව, දර්ශනය, කලාව, සාහිත්‍ය දේශපාලන ඉතිහාස රචනය සහ ග්‍රීක ශිෂ්ටාචාරයේ සෑම අංගයක්ම මානව තර්ක බුද්ධිය කෙරෙහි ග්‍රීකයන් තුළ තිබූ විශ්වාසය පෙන්නුම් කරයි. (.....) |
| 38. II ලෝක යුද්ධයෙන් අනතුරුව කොටස් දෙකකට බෙදනු ලැබූ රුසියාව 1989 දී යළි එක්සත් කරනු ලැබීය. | ලැන්කැස්ටර් හා යෝර්ක් යන රජපෙළපත් අතර ඇතිවූ යුද්ධය කුරුස යුද්ධය නමින් හැඳින්වේ. (.....) |
| 39. මුල්කාලීන ජාතික රාජ්‍යවල ප්‍රචලිතව පැවති ආණ්ඩුක්‍රමය නව රාජාණ්ඩුව ලෙස හඳුන්වයි. | තිස් අවුරුදු යුද්ධයෙන් පසු යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ සිදු නොවුණි. (.....) |
| 40. ම්ලේච්ඡ ආක්‍රමණ, බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීමට සැලකිය යුතු අන්දමින් හේතුවිය. | හිරෝෂිමාවට පරමාණු බෝම්බ හෙළීමත් සමග පළමු ලෝක යුද්ධය අවසන් විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඔබ කැමති ස්ථාන දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පෘතුගාලය | 2. | සාඩිනියාව | 3. | සේන් ගඟ |
| 4. | ඩැන්සිග් වරාය | 5. | ඊජියන් මුහුද | 6. | ප්‍රංශය |
| 7. | මැන්චෙස්ටර් | 8. | බොස්පරස් සමුද්‍ර සන්ධිය | | |

(සිතියම් ලකුණු කිරීමට 8 ඓතිහාසික සටහනකට 5 බැගින්) (8 + 5 x2 =18)

02. (i) බටහිර රෝම අධිරාජ්‍යයේ හා නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර පිළිවෙළින් නම් කරන්න. (ල. 2)

(ii) රෝමවරු දේවත්වය ආරෝපණය කොට වන්දනාමාන කළ අධිරාජ්‍යවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(iii) රෝම ආගම පිළිබඳව තොරතුරු සැකෙවින් දක්වන්න. (ල. 4)

(iv) රෝමවරුන්ගේ ආණ්ඩුක්‍රමය සැකෙවින් පරීක්ෂා කරන්න. (ල. 6)

03. (i) යුරෝපයේ මධ්‍යතන යුගයේ පැවති වැඩවසම් ආර්ථික හා සමාජ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දක්වන්න. (ල. 6)

(ii) වැඩවසම් ක්‍රමය පරිහානියට පත් වූ අයුරු පරීක්ෂා කරන්න. (ල. 8)

04. ''ජතික ඒකීයත්වයක් ඇතිකිරීමටත්, ශක්තිමත් මධ්‍යතන ආණ්ඩු නිර්මාණය කිරීමටත් ජාතික රාජ්‍යයෝ සමත් වූහ''

(i) ''ජාතික රාජ්‍ය'' යන්න නිර්වචනය කරන්න. (ල. 2)

(ii) යුරෝපයේ බිහිවූ මුල්ම ජාතික රාජ්‍ය තුන නම් කරන්න. (ල. 3)

(iii) එම ජාතික රාජ්‍යයන් අතරින් ඕනෑම ජාතික රාජ්‍යයක ප්‍රධාන කාර්ය සංසිද්ධීන් ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. (ල. 9)

05. ''කාර්මික විප්ලවය හේතුකොටගෙන යුරෝපයේ සෑම ක්ෂේත්‍රයකම පාහේ මූලික පරිවර්තනයක් ඇති විය.''

(i) කාර්මික විප්ලවය මුලින්ම එංගලන්තයේ ඇතිවීමට බලපෑ හේතු සැකෙවින් දක්වන්න. (ල. 4)

(ii) කාර්මික විප්ලවය මගින් යකඩ හා වානේ කර්මාන්තයේ ඇතිකරන ලද වෙනස්කම් මොනවාද? (ල. 4)

(iii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න (ල. 6)

06. පහත සඳහන් කරුණු ඇසුරින් නැපෝලියන් බොනපාට්ගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරන්න.

(i) ස්වකීය දේශය ගොඩනැගීම

(ii) ඔහුගේ රාජ්‍යෝත්පාය ප්‍රතිපත්ති

(iii) යුරෝපය කෙරෙහි ඔහු ඇති කළ බලපෑම. (ල. 14)

07. ''ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය බාධක රාශියකට මුහුණදුන් නමුත් ඒ සියල්ල ජය ගැනීමට ඉතාලි නායකයෝ සමත් විය''

(i) ඉතාලිය එක්සත් කිරීමට තිබූ බාධක මොනවාද? (ල. 5)

(ii) ඉතාලිය එක්සත් කිරීමේ අවස්ථා ඉහත සඳහන් ප්‍රකාශය යටතේ විමසන්න. (ල. 9)

08. (i) රුසියාවේ 1917 බෝල්ෂෙවික් විප්ලවය ඇතිවීමට තුඩුදුන් හේතු පසුබිම විස්තර කරන්න. (ල. 7)

(ii) බෝල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට තුඩුදුන් හේතු විස්තර කරන්න. (ල. 7)

09. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) පහත සඳහන් මාතෘකාඅතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) මාටිං ලූතර්

(ii) ජෝර්ජ් වොෂිංටන්

(iii) වියානා සමථය


(iv) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල

(v) ජාතීන්ගේ සංගමය (ල. 7 x 2)

(B) II ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ හේතු මොනවාදැයි පරීක්ෂා කරන්න. (ල. 14)

**12 / 13 යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| විභාග අංකය<br>சுட்டெண் | |
|---|---|



**දෙවන වාර පරීක්ෂණය 2018 -යුරෝපා ඉතිහාසය.**
**පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 5 | 11. | 5 | 21. | 2 | 31. | 3 |
| 2. | 2 | 12. | 2 | 22. | 3 | 32. | 4 |
| 3. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 5 |
| 4. | 2 | 14. | 5 | 24. | 3 | 34. | 5 |
| 5. | 3 | 15. | 4 | 25. | 1 | 35. | 4 |
| 6. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 7. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 5 |
| 8. | 4 | 18. | 5 | 28. | 1 | 38. | 3 |
| 9. | 3 | 19. | 1 | 29. | 1 | 39. | 2 |
| 10. | 4 | 20. | 4 | 30. | 3 | 40. | 1 |

(ලකුණු 40)

**<u>11 පත්‍රය - පිළිතුරු</u>**

01. නිවැරදි සිතියම් ලකුණු කිරීමට ලකුණු 08
ඓතිහාසික සටහන් ලකුණු 10
18

02. (i) රෝමය හා බයිසැන්තියම (කොන්ස්තන්තිනෝපලය) (ල. 2)
(ii) ඔගස්ටස්සීසර්, ඩයොක්ලිෂන් (ල. 2)
(iii) * ස්වභාවික වස්තූන්ට වන්දනාමාන කළ බව.
* බහුදේව වාදය - දෙවිවරු හා අධිපතීත්වය උදාහරණ ලෙස දක්විය යුතුය
* අධිරාජ්‍යවරන්ට දේවත්වය ආරෝපණය කිරීම.
* පසුකාලයකදී ක්‍රිස්තියානු ආගම රාජ්‍ය ආගම බවට පත්වීම. (ල. 4)
(iv) රාජාණ්ඩුව, සමූහාණ්ඩුව හා අධිරාජ්‍ය යන්න දක්වා උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.6)

03. (i) ආර්ථික : * කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකය. * ප්‍රධාන ආර්ථික ඒකකය - ප්‍රශේණිය/බණ්ඩාරගම
* ආර්ථික ස්වයංපෝෂිත බව. * වෙළඳාම හා මුදල් භාවිතය සීමිත වීම.
* රටේ භූමියේ හිමිකරු රජුය යන සංකල්පය. * රජු රදළ ප්‍රවේණිදාස සේවා සම්බන්ධතාවය.
සමාජ : * රදළ, ප්‍රභූ පන්තිය හා ප්‍රවේණිදාස පන්තිය.
* සමාජ තරාතිරම, උත්පත්තිය මත තීරණය වීම.
* රදළ ප්‍රභූ පන්තිය, වරප්‍රසාද භුක්තිවිඳීම.
* සාමූහික ජීවන රටාව
මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 6)

(ii) * වෙළඳාම පුළුල් වී යාම / වෙළඳ පන්තියක් බිහිවීම. * මුදල් භාවිතය පැතිර යාම/නගර බිහිවීම.
* ඉඩම් භුක්තිය මත පදනම් වූ සේවා සම්බන්ධතා දුර්වලවීම.
* සමාජ තරාතිරම තීරණය කිරීමේදී උපත වෙනුවට ධනය තීරණය කිරීම.
* සාමූහිකත්වය වෙනුවට පුද්ගලිකත්වය හා තරඟකාරීත්වය නැගී ඒම මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 8)

04. (i) නිශ්චිත දේශසීමාවකින් සහ නිශ්චිත ජන සංඛ්‍යාවකින් සමන්විතවූ සමාන භාෂාවක් ව්‍යවහාර කරන පොදු වූ ජාතික අනන්‍යතාවයකින් යුක්ත වූ දේශපාලන ඒකකය. (ල. 2)
(ii) එංගලන්තය, ස්පාඤ්ඤය, ප්‍රංශය (ල. 3)
(iii) * අභ්‍යන්තර ගැටීම් නිමකොට/අභ්‍යන්තර බෙදීම් නැතිකොට ජාතික එක්සත්භාවය ඇති කිරීම.
* බලය කේන්ද්‍රගතකරන ලද ස්වෛරී පරම රාජාණ්ඩු පාලනයක් ඇතිකිරීම. * ස්ථාවර හමුදාවක් ගොඩ නැගීම.
* රදළ බලය දුර්වල කිරීම. * මධ්‍යම පන්තියේ සහයෝගය ලබා ගැනීම. * ක්‍රිස්තියානි පල්ලිය රජයේ පාලනය යටතට ගැනීම.
ඉහත කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් අදාළ රටෙහි පාලකයන් එම රට තුළ ජාතික රාජ්‍යයක් ගොඩනඟන ලද ආකාරය විග්‍රහ කළ යුතුය. (ල. 9)

05. (i) * ජනගහනය අධික වීම / භාණ්ඩ වලට තිබූ වැඩි ඉල්ලුම. * යටත් විජිත වලින් අමුද්‍රව්‍ය ලබාගැනීමට හා වෙළඳපොළ සකසා ගැනීමට හැකිවීම/නිදහස් සමාජ පසුබිම. * විද්‍යා පුනරුදයේ නව සොයාගැනීම්/කුඩා දිවයිනක් වීම. * ධනපති පංතියක් තිබීම./දේශපාලන ස්ථාවරත්වය. * මධ්‍යම පන්තියක් තිබීම. (ල. 4)

(iii) 1730 - ඒබ්‍රහම් ඩර්බි - ගල් අඟුරු යොදා යපස් උණු කිරීමේ ක්‍රමය
1784 - හෙන්රි කෝට් - රෝලර් යන්ත්‍රය
1856 - විවෘත උඳුන් ක්‍රමය
1870 - විලියම් සීමන්ස් - යපස් උණු කිරීමට විදුලි උඳුනක්. (ල. 4)

(iv) * ගෘහකර්මාන්ත බිඳවැටීම / නගර බිහිවීම / නගර ජනාකීර්ණ වීම / පරිසර දූෂණය / ධනවාදී ආර්ථික රටාව / මුදල්මත රැඳුන පන්ති ක්‍රමය / නව අධිරාජ්‍යවාදය / වෘත්තීය සමිති / මාක්ස්වාදය / ලිබරල්වාදය. මේවා විස්තර කළ යුතුය. (ල. 6)

06. (i) * ප්‍රාග්තන පටිපාටියේ ඇතැම් අංග සහ ප්‍රංශ විප්ලවයක් ලැබුණු ඇතැම් අංග යන අංශ දෙකම නව පාලනයක් ගොඩනැගීම. * පෙරට වඩා කාර්යක්ෂම පාලන ක්‍රමයක් වීම. * සමාජීය වශයෙන් සමානාත්මතාවයක්.
* සුදුස්සාට සුදුසු තැන ලබාදීම / උසස්වීම් ලබාදීම. * නීති පද්ධතිය. * අධ්‍යාපන හා ආගමික ප්‍රතිසංස්කරණ ඇති කිරීම.

(ii) * ප්‍රංශ යුධ හමුදාවේ බටයකු වීම හා එයින් ප්‍රංශ ජනතාවගේ සිත් දිනාගැනීම.
* ජනතාවගේ අපේක්ෂාවන් ඉටුවන පරිදි ක්‍රියාකරන ලදී. * ඒකාධිපති බලයක් පවත්වාගෙ යාම.
* අන් රටවල් යටත් කර ගැනීම.
* තමන්ට යටත්කරගත නොහැකි වූ බ්‍රිතාන්‍යයට ආර්ථික අතින් පහර දීම. * මහද්වීපික ක්‍රමය.

(iii) * විශාල අධිරාජ්‍යයක් ඇතිකිරීම නිසා පෙර පැවති තත්වය අවුල් වීම. * විප්ලවීය මූලධර්ම හා ජාතිවාදි හැඟීම් යුරෝපා රටවලට ලබාදීම. * ඉතාලිය හා ජර්මනිය එක්සත් කිරීමට නැපෝලියන් විසින් ලබාදුන් ජාතික හැඟීම් හේතුවිය. (ල.14)

07. (i) * ප්‍රාදේශීය රාජ්‍යයන්ට බෙදී පැවතීම. * යුරෝපා රාජ්‍යයන් අතර වැදගත්කමක් නොතිබීම. * ඔස්ට්‍රියාවේ පාලකයා. * පාප් වහන්සේට යටත් වූ ස්වාධීන රාජ්‍යයක් වීම. * ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධ ජාතීන් පාලනය කිරීම. * එකමුතුකමක් නොවීම / ජාතික හැඟීම් පහළ නොවීම. *දක්ෂ නායකත්වයක් නොවීම. (ල. 5)

(ii) * 1848 විප්ලව. * මෙම විප්ලව මුල් අවස්ථාවේදී සාර්ථක වීම. * පිස්මොන්ට්- සාර්ඩිනියා රාජ්‍යයේ අගමැතිවරයා ලෙස කැවුර් පත්වීම. * ජලොම්බියස් ගිවිසුම. * ඔස්ට්‍රො - සාර්ඩිනියා යුද්ධය (1859) * ගැරිබොල්ඩි සිසිලි රාජ්‍ය ආක්‍රමණය කිරීම. (1860) * ගැරිබොල්ඩි විසින් තමා යටත් කරගත් ප්‍රදේශ වික්ටර් ඉමැනුවෙල් රජුට පැවරීම. * වික්ටර් ඉමැනුවෙල් ඉතාලියේ රජු ලෙස ප්‍රකාශ කිරීම. * වෙනීසියාව ඈඳ ගැනීම. * රෝමය ඈඳ ගෙන ඉතාලිය එක්සත් වීම සම්පූර්ණ වීම. (ල. 9)

08. (i) * රුසියානු රාජාණ්ඩුවේ ඒකාධිපති ස්වභාවය හා අකාර්යක්ෂමබව. * රුසියානු I ලෝක යුද්ධයට සම්බන්ධ වීම.
* රුසියානු භාණ්ඩාගාරය බංකොලොත්වීම. * රුසියානු ජනතාවගේ විරැකියාව හා දරිද්‍රතාව.
* ශ්‍රම සූරාකෑමේ ස්වභාවය. * සමාජ අසහනය. * සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනය. (ල.7)

(ii) * ලෙනින් හා ට්‍රොට්ස්කිගේ නායකත්වය. * සෝවියට් සභා හා තාවකාලික ආණ්ඩුව අතර ඇති වූ ප්‍රතිවිරෝධතාව.
* පීඩිත පන්තිය විප්ලවවාදීන්ට සහාය දීම. * වැඩවර්ජන ව්‍යාපාර * සංවිධාන ශක්තිය.
(ල. 7)

09. (A) අදාළ පිළිතුර සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 7 2 = 14)
(B) අදාළ පිළිතුර සඳහා ලකුනු ලබාදෙන්න. (ල. 14)